මගේ අංකය : JSC/SEC/CIR/2022

සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,

සියළුම අධිකරණ නිලධාරීන්,

සියළුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් සහ

රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත,

අධිකරණවල කාර්ය මණ්ඩල කැඳවීම සම්බන්ධවයි

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක : EST-6/03/LEA/1060 හා 2022.05.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2022 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි. අධිකරණවල සේවා අවශ්‍යතාවය සැලකීමට ගෙන අධිකරණවල දෛනික කටයුතුවලට බාධාවක් නොවන පරිදි අත්‍යාවශ්‍ය අවම නිලධරයන් / සේවකයන් පමණක් 2022.05.26 දින සිට සේවයට කැඳවීම සම්බන්ධයෙන් සුදුසු වැඩ පිළිවෙලක් ඔබ විසින් සකසා ක්‍රියාත්මක කරන ලෙස ඔබට දැන්වීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මට නියම කර ඇත.

02. අංක 10/2022 දරණ චක්‍රලේඛයේ පිටපතක් මෙයට අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 මැයි මස 26 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2022

මගේ අංකය : EST-6/03/LEA/1060
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.05.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම</u>**

ඉන්ධන සපයා ගැනීම සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු හේතුවෙන් පොදු සහ පෞද්ගලික ප්‍රවාහන සේවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා රජයේ නිලධරයන්ට සේවය සඳහා වාර්තා කිරීමේ දී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුව ඇති බවට වන නියෝජනයන් විවිධ පාර්ශව වෙතින් ඉදිරිපත්ව ඇත. තව ද මෙම දුෂ්කර කාලසීමාව තුළ ඉන්ධන, විදුලිය සහ ජලය සඳහා වන රජයේ වියදම් ද සීමා කළ යුතුව ඇත.

02. ඉහත සඳහන් කරුණු පිළිබඳ 2022.05.23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අවධානය යොමු වී ඇති අතර, රජයේ කාර්යාලවලින් පොදු මහජනතාවට ඉටු වන කාර්යයන්ට බාධාවක් නොවන පරිදි රජයේ නිලධරයන් සේවයට කැඳවීම සීමා කිරීමට තීරණය කර ඇත. ඒ අනුව නැවත උපදෙස් ලබා දෙන තෙක් ඔබ යටතේ පවත්නා ආයතන මඟින් සපයනු ලබන මහජන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය අවම නිලධරයන් පමණක් 2022.05.26 දින සිට සේවයට කැඳවීම සම්බන්ධයෙන් සුදුසු වැඩපිළිවෙළක් ඔබ විසින් සකසා ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වමි.

03. මෙහි දී රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2022.03.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2022 කෙරෙහි ද අවධානය යොමු කර කටයුතු කරන මෙන් වැඩිදුරටත් අවධාරණය කරමි.

04. තව ද, රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු ය.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය